**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය - 2015**

---

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිනපොත් මුද්‍රණය සඳහා ලබාගත් අත්තිකාරම් ලෙස ලද රු.123,000 ක් හා මානව සම්පත් සංවර්ධනය සඳහා අත්තිකාරම් රු.391,117 ක් ද සුළු වියදම් සඳහා අත්තිකාරම් රු.30,000 ක් ද 2015 දෙසැම්බර් 31 දිනට නිරවුල් වී ඇතත් තවදුරටත් අයවිය යුතු අත්තිකාරම් මුදල් ලෙස දක්වා තිබුණි.

(ආ) UN Habitat ආයතනයෙන් ලද රු.186,259 ක් වෙනත් ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට ව්‍යාපෘති දායකත්ව ගිණුමට බැර කර තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ආයතනය විසින් මුද්‍රණය කරන ලද දින පොත් සඳහා ගෙවීම් පරික්ෂාවේදී පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබාගත් දින පොත් වෙනුවෙන් ලැබිය යුතු රු.492,000 ක මුදල 2016 ජුනි 30 දින වන විටත් ආයතනයට ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2010 වර්ෂයට පෙර සිට නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.44,657 ක අත්තිකාරම් හා රු.455,664 ක ආපදා ණය මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආයතනය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට සේවක ණය ගිණුමෙහි පැවති රු.52,811 ක අසාමාන්‍ය බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIV පරිච්ඡේදයේ 4.1 වගන්තිය | වැඩමුළු සඳහා සහභාගී වූ නිලධාරීන්ට ආහාරපාන හා නේවාසික ගාස්තු ආයතනයේ වියදමින් ලබා දී තිබියදී එම දින සඳහා සංයුක්ත දීමනාවද ලබා දී තිබූ අවස්ථා නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 264 - සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුන බවට කුවිතාන්සියක් ලබාගත යුතු වුවත් එසේ නොමැතිව වටිනාකම රු.138,137 ක ගෙවීම් කර තිබූ අවස්ථා 6 ක් නිරීක්ෂණය විය.

(ii) මුදල් රෙගුලාසි 371

- ලබාදී ඇති අත්තිකාරම් අඩකට වඩා හෝ ඊට ආසන්න ප්‍රමාණයක් ඉතිරි කර පියවා තිබූ අවස්ථා 20 ක් නිරීක්ෂණය විය.
- ලබාදී ඇති අත්තිකාරම් ඒවා නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී දෙන ලද රු.50,360 ක අත්තිකාරම් 02 ක් එසේ පියවා නොතිබුණි.

**2.5** **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයන්හට අතිරේක දීමනා හා වෙනත් වර්ගවල මූල්‍යමය ප්‍රතිලාභ ගෙවිය හැක්කේ අමාත්‍ය මණ්ඩලයේ හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමතිය මත පමණක් වුවද, ඊට පටහැනිව UN Habitat ආයතනය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC Project) මඟින් ලබා දුන් උපදේශක තත්ත්වයේ පැවරුම්හි කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ නිළධාරින් වෙත රු. 193,750 ක විවිධ දීමනා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි.

**3** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,927,273 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,502,704 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.575,431 ක ඌනතාවයේ අඩුවීමක් ඇති වී තිබුණි.වෙනත් ආදායම් රු.4,924,153 කින් අඩු වුවද පුනරාවර්තන ප්‍රදාන රු.5,692,000 කින් වැඩිවීම ඉහත ඌනතාවයේ අඩුවීමට බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.2,882,054 ක්ව පැවති ආයතනයේ අතිරික්තය 2015 වර්ෂය වනවිට රු.1,927,273 ක ඌනතාවයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.20,668,188 ක්වූ ආයතනයේ දායකත්වය උච්චාවචනය වෙමින් 2015 වර්ෂය අවසන් වනවිට රු.29,788,488 ක්වී තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**4.1 කාර්යසාධනය**

------------------

පළාත් සභා හා පලාත් පාලන ආයතනවල සභිකයින්, නිලධාරින් හා සේවකයින්ට ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස ඉටු කිරීමට හැකි වන පරිදි වැඩමුළු හා පුහුණු පාඨමාලා පැවැත්වීම ආයතනයේ කර්තව්‍යයක් වන අතර ඒ වෙනුවෙන් අංශ 8 ක් සඳහා වාර්ෂික අයවැය මගින් රු.20,000,000 ක මුදලක් වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මේ සඳහා රු.19,597,500 ක් වැය කර තිබුණ ද, ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේදී ආයතනය සැලසුම් කළ කාර්යසාධනය සිදු වී නොතිබුණු බව හා එක් එක් අංශයේ ප්‍රගති වාර්තා හා සැලසුම් කළ කාර්යයන් අතර වෙනස්කම් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

**(අ) පොදු කළමනාකරණ අංශය**

--------------------------------

වැඩසටහන් පැවැත්වීමේදී අපේක්ෂිත වැඩසටහන් වලට වඩා වැඩියෙන් වැඩසටහන් 5ක් ද අපේක්ෂිත වැඩසටහන් වලට වඩා අඩුවෙන් වැඩසටහන් 7 ක් ද පවත්වා තිබුණි. සැලසුම අනුව අපේක්ෂිත සහභාගීත්වය 1670 ක් වුවද 1834 ක් සහභාගි වී තිබුණි.

**(ආ) පර්යේෂණ අංශය**

--------------------

පසුගාමී පළාත් පාලන ආයතනවල ආදායම් වැඩිකර ගැනීමේ අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳව වැඩසටහන් 18 ක් කිරීමට සැලසුම් කර තිබුණද පවත්වා තිබුණේ වැඩසටහන් 9 ක් පමණි. මෙම අංශය සඳහා ඇස්තමේන්තු මුදල රු.2,400,000 ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය රු.2,190,538 ක් වූයෙන් ඉතිරි වැඩසටහන් 9 පැවැත්වීම සඳහා ප්‍රමාණවත් පරිදි මුදල් ඉතිරියක් සිදුවී නොතිබුණි. සැලසුම් සහගතව වැඩසටහන් පවත්වා නොතිබුණු අතර වියදම් කළමනාකරණය කෙරෙහිද අවධානය යොමුකර නොතිබුණි.

**(ඇ) ඉංජිනේරු අංශය**

--------------------

මෙම අංශයේ ඉලක්ක ගත වැඩසටහන් ප්‍රමාණයට වඩා සෑම වැඩසටහනක්ම අඩුවෙන් සිදුකර තිබුණි. තාක්ෂණ නිළධාරීන්ගේ දැනුම හා හැකියාව වර්ධනය වැඩසටහන් 9 න් 4 ක්ද වැඩ අධීක්ෂණයන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ වැඩසටහන් 6 න් 1 ක්ද පළාත් පාලන ආයතන වල කොන්ත්‍රාත් කළමනාකරණය සම්බන්ධ කාර්ය මණ්ඩලය සඳහා වූ තාක්ෂණික පුහුණු පාඨමාලා 6 න් 3 ක්ද ඉංජිනේරු නිර්ණායකයන්ගේ කාර්ය සාධන වර්ධනය වැඩසටහන් 4 න් 2 ක්ද ග්‍රාමීය මාර්ග පද්ධතිය යාවත්කාලීන කිරීමේ වැඩසටහන් 4 න් 2 ක්ද විශේෂිත පුහුණු පාඨමාලා වැඩසටහන් 3 න් 1 ක් ද සිදුකර නොතිබුණි. අඩකටත් වඩා වැඩසටහන් පවත්වා නොතිබුණද වෙන්කරන ලද ඇස්තමේන්තුව රු.2,400,000 හි මූල්‍ය කාර්යසාධනය රු.2,333,630 ක් වී තිබුණි.

**(ඈ) මූල්‍ය අංශය**

--------------

මූල්‍ය කළමනාකරණ අංශයේ වැඩසටහන් 03 ක් පමණක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබූ අතර වසරක පමණ කාලයක සිට මූල්‍ය උපදේශකවරයෙකු නොසිටීම නිසා ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවද පවත්වා නොතිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වැඩසටහන් 6 ක් සඳහා රු.මිලියන 1.2 ක් වෙන්කර තිබුණද රු.550,013 ක් වැයකර වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබුණි. පළාත් පාලන ආයතනවල මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැඩසටහන් 4 ක් සඳහා රු. 800,000 ක් වෙන්කර තිබූ අතර රු. 1,623,682 ක් වැය කර වැඩසටහන් 8 ක් පවත්වා තිබුණි. පළාත් මට්ටමේ වැඩසටහන් සඳහා රු.400,000 ක් වෙන්කර තිබුණද

රු.791,554 ක් වැය කර තිබුණි. මේ අනුව මෙම අංශය සඳහා වෙන්කරන ලද ඇස්තමේන්තු සීමාව තුළ කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඉ) නීති අංශය**

-------------

ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම , පළාත් පාලන ආයතන වලට අදාල නීති හඳුන්වා දීම, පළාත් පාලන ආයතන වල නීති ගැටලු සම්බන්ධයෙන් උපදෙස් සැපයීම යන වැඩසටහන් පවත්වා නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

වටිනාකම රු.311,000 කට වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අත්තිකාරම් ලෙස රු.77,500 ක් 2014 ඔක්තෝබර් 28 දින පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණු අතර 2015 දෙසැම්බර් 31 වන විටද එය නිම කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණු බැවින් අත්තිකාරම් ලෙස ගෙවා ඇති මුදල නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

--------------------------------

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ඉදිරි අවශ්‍යතා පිළිබඳ විධිමත් අධ්‍යයනයකින් තොරව ඉදිකිරීම් සැලසුම් කිරීම නිසා 2013 නොවැම්බර් 28 දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන භූමියේ ඉදිකිරීමට නියමිත ගොඩනැගිල්ලේ තට්ටු 4 ක් සඳහා රු.මිලියන 53 කට එළඹි කොන්ත්‍රාත් ගිවිසුම් මුදල පසුව රු.මිලියන 98 දක්වා වැඩි කිරීම නිසා සියයට 85 ක ප්‍රමාණයකින් මිල විචලනයක් සිදු වී තිබුණි. නව කොන්ත්‍රාත් මුදල වන රු.මිලියන 98 සඳහා 2014 දෙසැම්බර් 30 දින එළඹි ගිවිසුම අනුව කොන්ත්‍රාත් කාලය 2015 අගෝස්තු මාසයෙන් අවසන් වී ඇති අතර, 2016 අගෝස්තු මස අවසන් වන විට රු. 44,757,072 ක් වැයකර පයිලින් (piling) වැඩ අවසන් වී අත්තිවාරම සකස් කර කණු ඉහලට නැංවීම පමණක් සිදු කර තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

2015 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 59 ක් හා 40 ක්වූ අතර පුරප්පාඩු හා අතිරික්ත සංඛ්‍යාව පිළිවෙලින් 23 ක් හා 4 ක් විය. අංශ 05ක් සඳහා මාණ්ඩලික මට්ටමේ තනතුරු වන උපදේශකයන් පුරප්පාඩු වීම හේතුවෙන් පුහුණු වැඩමුළු පැවැත්වීමේදී ආයතනයට දුෂ්කරතා වලට මුහුණදීමට සිදුවී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු බව සඳහන් වුවද, ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 අගෝස්තු 01 දින දීය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

-------------------------------

2014 මාර්තු 05 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණය අනුව 2011 වර්ෂය හා ඊට පසු ගෙවන ලද ප්‍රසාද දීමනා සඳහා ආවරණ අනුමැතිය භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු බව දන්වා ඇතත් 2015 ජූනි මස අවසන් වන විටත් එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව ආයතනයේ සභාපතිවරයා වෙත වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අත්තිකාරම් | අදාළ කාර්යය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමකින් තොරව වැඩියෙන් අත්තිකාරම් ලබාදීම. |
| (ආ) | සේවක ණය | හිඟ ණය මුදල් අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබීම. |
| (ඇ) | වැඩමුළු පැවත්වීම හා දීමනා ගෙවීම | ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් පැවැත්වීමේදී අපේක්ෂිත සංඛ්‍යාවට වඩා වැඩියෙන් හා අඩුවෙන් වැඩසටහන් පැවැත්වීම හා බාහිර පැවරුම්හි කාර්යයන් සඳහා විවිධ දීමනා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබීම. |